LIGHT OF THE WORLD EDUCATIONAL AND SOCIAL SERVICES FOUNDATION

# CURRENCY MUSEUM

# මුදල් කෞතුකාගාරය



## කෞතුකාගාර මාර්ගෝපදේශ සංග්‍රහය

(කෞතුකාගාර තෙවස් පූර්ණය සමරමින් එළිදක්වන කෞතුකාගාරය සහ එහි සේවාවන් පිළිබඳ විග්‍රහය)

Scanned with CamScanner

# LIGHT OF THE WORLD EDUCATIONAL AND SOCIAL SERVICES FOUNDATION

# CURRENCY MUSEUM

## මුදල් කෞතුකාගාරය

# කෞතුකාගාර මාර්ගෝපදේශ සංග්‍රහය

**(කෞතුකාගාර තෙවස් පූර්ණය සමරමින් එළිදක්වන කෞතුකාගාරය සහ එහි සේවාවන් පිළිබඳ විග්‍රහය)**

කර්තෘ

සුමේද විරාජ් අපෝන්සු

LIGHT OF THE WORLD

LIGHT OF THE WORLD අධ්‍යාපනික හා සමාජ සේවා පදනමෙහි ප්‍රකාශනයකි.

Scanned with CamScanner

# පටුන

| | | පිටු අංකය |
|---|---|---|
| *. | පිළිගැන්වීම | I |
| *. | පෙරවදන | II |
| *. | ජ්‍යෙෂ්ඨ උපදේශකතුමාගේ පණිවිඩය | III |
| *. | කර්තෘගෙන් | IV |
| 01. | කෞතුකාගාර සේවය | 1 |
| 02. | කෞතුකාගාර සේවය පිළිබඳ කෙටි හැඳින්වීමක් | 2-3 |
| 03. | ලක්දිව මුදල් භාවිතයේ ඉතිහාසය | 4-15 |
| 04. | පළමු ප්‍රදර්ශන අල්මාරිය | 16-37 |
| 05. | දෙවන ප්‍රදර්ශන අල්මාරිය | 38-42 |
| 06. | තෙවන ප්‍රදර්ශන මේසය | 43-54 |
| 07. | සිව්වන ප්‍රදර්ශන මේසය | 55-61 |
| 08. | පස්වන ප්‍රදර්ශන අල්මාරිය | 62 |
| 09. | හයවන ප්‍රදර්ශන අල්මාරිය | 63 |
| 10. | විද්‍යුත් පුස්තකාල එකතුවෙහි ප්‍රදර්ශිත කාසි | 64-73 |
| 11. | මුදල් නෝට්ටු ආරක්ෂණ සළකුණු නිරීක්ෂණය | 74-75 |
| 12. | කෞතුක භාණ්ඩ ගබඩාකරණය | 75-76 |
| 13. | කෞතුක භාණ්ඩ ලියාපදිංචි කිරීම | 77 |
| 14. | කෞතුකාගාර කළමනාකරණය | 78-79 |
| 15. | නරඹන්නාට සැපයෙන පහසුකම් | 80-85 |
| 16. | ශුද්‍රඅත විශ්ලේෂණය | 86-87 |
| 17. | කෞතුකාගාර ඉදිරි සැලසුම් | 88 |
| 18. | කෞතුකාගාරය නරඹන්නන්ගේ අදහස් | 89 |
| 19. | කෞතුකාගාරය නරඹන්නන්ගේ සේයා රූ | 90 |
| 20. | සමාජ සේවා පදනමෙහි සේවයෙන් බිඳක් | 91-92 |
| * | ආශ්‍රිත ග්‍රන්ථ | 93 |

Scanned with CamScanner



# LIGHT OF THE WORLD CURRENCY MUSEUM

## කෞතුකාගාර මාර්ගෝපදේශ සංග්‍රහය

සුමේද විරාජ් අපෝන්සු

අත්භූත, කලාත්මක හෝ කෞතුකමය අගයක් ඇති වස්තු හෝ එවැනි එකතු පවත්වාගෙන යාමේ පුරුද්ද මානව ශිෂ්ටාචාරයේ ඉතා ඈත කලෙක සිට පැවතෙන්නකි. ලොව ඇතැම් දියුණුතම කෞතුකාගාරවල ප්‍රභවයේ පදනම ද එවැනි එකතූන් ය. LIGHT OF THE WORLD පදනම යටතේ මොරටුව ලුනාවෙහි මීට තුන් වසරකට පෙර ඇරඹි පැරණි මිල මුදල් පිළිබඳ කෞතුකාගාරය ද එම පැරණි සම්ප්‍රදාය තවමත් පවතින බව තිර කරන නවත් එක් නිදසුනක් සේ සැලකිය හැකි ය. මෙම ආයතනය පවත්වාගෙන යාමට මහත් වෙහෙස දරන එහි නිර්මාතෘ සුමේද විරාජ් අපෝන්සුගේ මෙම උත්සහය වෙසෙසින් ම පැසසුමට ලක්විය යුතුය.

ශ්‍රී ලංකාවේ මුල් ම බෞද්ධ මිශ්‍ර පාසලෙන් මූලික අධ්‍යාපනය ලද සුමේද විරාජ් අපෝන්සු මහතා සිය ද්විතීයික අධ්‍යාපනය ලැබුවේ මොරටුව ශාන්ත සෙබස්තියන් විදුහලෙනි. කැලණිය විශ්වවිද්‍යාලයෙන් සංචාරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණ ගෞරව ශාස්ත්‍රවේදී උපාධිය 2017 වර්ෂයේදී දිනාගත් ඔහු මේ වන විට සබරගමුව විශ්වවිද්‍යාලයේ සංචාරණය පිළිබඳ ව්‍යාපාර පරිපාලනය ශාස්ත්‍රපති උපාධිය හදාරමින් සිටී. එම අධ්‍යයන කටයුතුවලට අදාළව 2019 ජපානයේ රිට්සුමේකින් විශ්වවිද්‍යාලය හා ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය එක්ව ජපානයේ පැවැත් වූ ක්ෂේත්‍ර අධ්‍යයන වැඩමුළුව සඳහා ඔහු ශ්‍රී ලංකාව නියෝජනය කළේය.

කැලණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අධ්‍යයනාංශයේ සංචාරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය විෂය පිළිබඳ තාවකාලික කථිකාචාර්යවරයෙකු වශයෙන් කටයුතු කළ සුමේද විරාජ් අපෝන්සු මේ වන විට බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතනයෙහි සංචාරණය විෂය පිළිබඳ බාහිර කථිකාචාර්යවරයෙකු වශයෙන් කටයුතු කරයි.

ශ්‍රී ලංකාවේ කිමිදුම් සංචරණය ප්‍රවර්ධනය, අස්පෘශ්‍ය සංස්කෘතිකාංග ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම හා උරුම කළමනාකරණය පිළිබඳ පර්යේෂණ ගණනාවක් සිදුකර ඇති මොහු තමන් ලද අත්දැකීම් ද පාදක කරගෙන ස්වකීය වෘත්තිය ප්‍රායෝගික යථාර්තයක් බවට පත් කිරීමට සමත්ව සිටී. වෙසෙසින්ම LIGHT OF THE WORLD පදනම යටතේ මුදල් කෞතුකාගාරයක් ස්ථාපිත කිරීම මඟින් ඔහු සෙසු තරුණ විද්‍යාර්ථීන්ට යහපත් පූර්වාදර්ශයක් සපයා ඇත. ස්වකීය නිර්මාතෘත්වයෙන් ස්ථාපිත කෞතුකාගාරය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයක් එළිදැක්වීමට ක්‍රියාකිරීම ද ඊට අත්‍යවශ්‍ය ම අංගයක් සම්පූර්ණ කිරීමකි.

ශ්‍රී ලංකාවේ මිල මුදල් ඉතිහාසය පිළිබඳ ඉංග්‍රීසි බසින් පළ කෙරුණු පර්යේෂණ ග්‍රන්ථ තිබුණ ද මෙම විෂය පිළිබඳ උනන්දුවක් දක්වන පාඨකයන්ට රුචි සිංහල බසින් ලියැවුණු කෘති විරලය. එම අඩුව පිරිමසනු සඳහා මෙම කෘතිය මහත් රුකුලක් වෙයි. ශ්‍රී ලංකාවේ භාවිත පුරාණතම කාසිවල සිට නූතන සමය තෙක් පරිහරණය කරන මිල මුදල් සම්බන්ධ තොරතුරු එකිනෙකට මනාව පෙළ ගස්වමින් සුමේද විරාජ් අපෝන්සු විසින් රචිත ඔහුගේ මෙම කුලුදුල් ග්‍රන්ථය සිය කතුවර දිවියෙහි දිගු ගමනක ශක්තිමත් පදනම වන බව නොඅනුමානය.

ඒ වෙනුවෙන් ඔහුට අප කාගේත් සුභාශිංසන හිමිවිය යුතුමය.

රංජිත් හේවගේ
කෞතුකාගාර අධිකාරී
කොළඹ ජාතික කෞතුකාගාරය

**ප්‍රකාශනය**

LIGHT OF THE WORLD අධ්‍යාපනික හා සමාජ සේවා පදනම

LIGHT OF THE WORLD

නො : 01/04 මහල් නිවාස සංකීර්ණය, 80 වත්ත,
ලුනාව, මොරටුව.

lotwfoundation@gmail.com
+94 115 724 820

Rs.980.00

ISBN 978-624-5388-00-4

Scanned with CamScanner